සැ. යු.-2011.06.10 දින පළ වූ අංක 1,710 දරන ගැසට් පත්‍රයේ III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,711 - 2011 ජුනි මස 17 වැනි සිකුරාදා - 2011.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ජෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 798 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 808 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජුනි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජුනි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

795- B 80233— 8,870 (2011/06)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2011 ජූලි මස 18 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 මැයි මස 19 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මහනුවර | අකුරණ | හාරිස්පත්තුව උඩගම්පහ අංක 03 කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම්, කාර්යාලය, මහනුවර. |

06-152

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2011 ජූලි මස 11 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 මැයි මස 23 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| බදුල්ල | පස්සර | පස්සර නගර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල. |

06-244

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — හම්බන්තොට දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2011 ජූලි මස 18 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 මැයි මස 23 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| හම්බන්තොට | අඟුණකොළ-පැලැස්ස | වැව්ගම්පළාත කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ නැගෙනහිර ගිරුවාපත්තුව කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර්-ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට. |

06-337

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2011 ජූලි මස 18 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 මැයි මස 25 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) සහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය - (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

06-338

## ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව

### ආධුනික ශිෂ්‍යභට නිලධාරි සහ ආධුනික කාන්තා ශිෂ්‍යභට නිලධාරි පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ පහත සඳහන් ශාඛාවල ආධුනික ශිෂ්‍යභට නිලධාරීන් සහ ආධුනික කාන්තා ශිෂ්‍යභට නිලධාරිනියන් සඳහා පුරප්පාඩු පවතී :-

(අ) නියමු පොදු රාජකාරි ශාඛාව (පිරිමි);
(ආ) උපකරණ ශාඛාව (පිරිමි සහ කාන්තා);
(ඇ) පරිපාලන ශාඛාව (පිරිමි);
(ඈ) පරිපාලන රෙජිමේන්තු ශාඛාව (පිරිමි සහ කාන්තා);
(ඉ) මෙහෙයුම් ගුවන් ශාඛාව (පිරිමි).

2. පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

(අ) *BSc. (Aviation Studies) උපාධි වැඩසටහන් යටතේ ඇතුල්වීමේ සුදුසුකම් (කැළණිය විශ්වවිද්‍යාලය මගින් පිළිගත්)* :

*නියමු පොදු රාජකාරි/උපකරණ/පරිපාලන/පරිපාලන රෙජිමේන්තු සහ මෙහෙයුම් ගුවන් ශාඛාවන්* :

අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 04ක් සහිතව විෂයයන් 06කින් සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද ලබා සිටිය යුතුයි. (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) තව ද අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරක දී භෞතික/ජීව විද්‍යා/වාණිජ්‍ය යන විෂය ධාරාවන්ගෙන් (අදාළ ලෙස) විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ආ) *උපාධි රහිත වැඩසටහන යටතේ ඇතුල්වීමේ සුදුසුකම්* :

*නියමු පොදු රාජකාරි/උපකරණ/පරිපාලන/පරිපාලන රෙජිමේන්තු සහ මෙහෙයුම් ගුවන් ශාඛාවන් :*

අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 04ක් සහිතව විෂයයන් 06කින් සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද ලබා සිටිය යුතුයි. (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර). තව ද අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් එක් වරක දී භෞතික/ජීව විද්‍යා/වාණිජ්‍ය යන විෂය ධාරාවන්ගෙන් (අදාල ලෙස) විෂයයන් දෙකකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි. තව ද අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් එක් වරක දී කලා විෂය ධාරාව සඳහා පෙනී සිට අවම වශයෙන් විෂයයන් දෙකකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටින ශිෂ්‍යයින්ට ද පරිපාලන රෙජිමේන්තු ශාඛාව සඳහා අයදුම්කළ හැක.

3. *අනෙකුත් සුදුසුකම්.*—අයදුම්කරුවන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතුයි :-

(අ) *පුරවැසිභාවය* : ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි;

(ආ) *වයස* : 2011 සැප්තැම්බර් මස 30 දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 22ට නොවැඩි විය යුතුයි;

(ඇ) *උස* : *පිරිමි* - අඩි 5යි අඟල් 6කට නොඅඩු විය යුතුයි; *කාන්තා* - අඩි 5යි අඟල් 4කට නොඅඩු විය යුතුයි;

(ඈ) *බර* : 19 < ශරීර ස්කන්ධ දර්ශකය < 25
ශරීර ස්කන්ධ දර්ශකය = $\frac{\text{බර (කි. ග්‍රෑ)}}{\text{උස}^{2}\text{ (මී)}}$

(ඉ) *පපුව* : පිරිමි - අඟල් 32ට නොඅඩු විය යුතුයි;

(ඊ) *වර්ණ දෘෂ්ටිය* : සීපී 2;

(උ) *දෘෂ්ටි තීක්ෂණත්වය* : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිත)

(ඌ) *සිවිල් තත්ත්වය* : අපේක්ෂකයින් අවිවාහක විය යුතුයි. කිසිම ආධුනිකයෙකුට පුහුණුව ලබන කාලයේ දී සහ අධිකාරියට පත්කළ දින සිට වසරක් ගතවන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

4. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ට දක්ෂතා ගැන නිසි ලෙස සලකා බලනු ලැබේ.

5. ඉහත සඳහන් 2 සහ 3 ඡේදවල දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිම්වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුව ද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු/ඇය ගැන සලකා බලනු ලැබේ.

6. *සේවා කොන්දේසි* :

(අ) අපේක්ෂකයින් අනෙකුත් නිලයන් හා සමානව,මූලිකව නිත්‍ය සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර, ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ. ආධුනිකයා ලබා ඇති ශාඛාව අනුව මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තීය පුහුණුව නිමවීමෙන් පසු, ඔහු/ඇය ප්‍රථමයෙන් බඳවා ගනු ලැබූ නිලයෙන් වෙනස්ව නියමු නිලධාරි නිලයේ ස්ථිර අධිකාරියට පත් කරනු ලැබේ.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයන් සූදානමින් සිටිය යුතුයි.

(ඇ) පුහුණුව ලබන කාල සීමාව තුළ දී හා ඉන් පසුව පුද්ගලයින් ගුවන් හමුදා නීතියට යටත් විය යුතුයි.

(ඈ) සෑම ආධුනිකයකුට ම සියලුම ආයිත්තම් සහිත නිල ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයන් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුදා භෝජනාගාර තුලින් ආහාර සපයනු ලැබේ.

(ඊ) අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළ දී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුවේ.

(උ) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිවයුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදී ම අදාළ ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

(ඌ) මව, පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) හා (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයැදුම්පත්‍රයෙහි 27 වැනි කොටුවේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයැදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජය සමඟ මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතුය.

(එ) දෙවැනි සහ තෙවැනි ඡේදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්ෂකයින් මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් නිලධාරි තත්ත්ව පරීක්ෂාව සඳහා කැඳවනු ලැබේ. නිලධාරි තත්ත්ව පරීක්ෂාවෙන් සමත්වන්නන් වෛද්‍ය පරීක්ෂණයට (ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරාගනු ලබන සියලුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.) සුදුසුකම් ලබයි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්වන නියමු පොදු රාජකාරි ශාඛාවේ අයදුම්කරුවන්හට පමණක් පියාසර යෝග්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ. මෙම පරීක්ෂණයන්ගෙන් සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ගෙන් එම ශාඛාවන්ට අවශ්‍ය වන්නාවූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන්හි දී සහ සම්මුඛ පරීක්ෂණයන්හි දී දැක්වූ කුසලතා මත තෝරාගනු ලැබේ.

(ඒ) අවිවාහක නිලධාරීන්, නිලධාරි නිවස්නයේ සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. බැට්මන් සේවය සපයනු ලැබේ. අවිවාහක නිලධාරීන්ගේ ආහාර දීමනා හා බැට්මන් දීමනාව නිලධාරි නිවස්නයට ගෙවනු ලැබේ.

(ඔ) විවාහක නිලධාරීන් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අයකරනු ලැබේ.

(ඕ) සියලුම නිලධාරීන් රාජකාරි හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

(ක) සියලුම නිලධාරීන් ගුවන් හමුදා පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

7. *රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා.*—තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

8. *වැටුප් හා දීමනා :*

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනික කැඩෙට් නිලධාරීන්ගේ සහ අධිකාරිලත් නිලධාරීන්ගේ වැටුප් ක්‍රමය පහත සඳහන් පරිදි වේ. :-

ඔෆිසර් කැඩෙට් - රු. 1,80,240 වසරකට;
පයිලට් ඔෆිසර් - රු. 2,29,200 වසරකට;
ෆ්ලයින් ඔෆිසර් - රු. 2,75,220 - 34 x 7,740 = රු. 5,38,380 වසරකට;
ෆ්ලයිට් ලෙප්ටිනන් - රු. 3,21,660 - 28 x 7,740 = රු. 5,38,380 වසරකට;
ස්කොඩ්‍රන් ලීඩර් - රු. 3,52,620 - 24 x 7,740 = රු. 5,38,380 වසරකට;
විංග් කොමාන්ඩර් - රු. 3,62,100 - 20 x 9,480 = රු. 5,51,700 වසරකට;
ගෲප් කැප්ටන් - රු. 4,41,060 - 18 x 12,600 = රු. 6,67,860 වසරකට.

(ආ) *අනෙකුත් දීමනා :*

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 5,850ක් ගෙවනු ලැබේ.

(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනාව වශයෙන් මසකට රු. 250ක් ගෙවනු ලැබේ.

(3) දුෂ්කර දීමනා මසකට රු. 600ක් ගෙවනු ලැබේ.

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන්හට මසකට රු. 5,000ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව මසකට රු. 3,000ක් ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 100 බැගින් ගෙවනු ලැබේ.)

(6) විශේෂ දීමනාව මසකට රු. 1,000ක් ගෙවනු ලැබේ.

(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255 ක් ගෙවනු ලැබේ.

(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50ක් ගෙවනු ලැබේ. (කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා).

(9) ආහාර දීමනාව මසකට රු. 11,464.50ක් ගෙවනු ලැබේ. (කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා).

(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි මසකට උපරිම රු. 637.50ක් ගෙවනු ලැබේ.

(11) විශේෂ දීමනාවක් ලෙස මසකට මූලික වැටුපෙන් 5% මුදලක් ගෙවනු ලැබේ.

(12) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට, කාලත්‍රයාට සහ ළමයින්ට) දෙනු ලැබේ.

(13) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(14) නිල ඇඳුම් සහ ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(15) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට) සපයනු ලැබේ.

(16) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරීන්හට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට ගමන් කිරීම සඳහා නොමිලේ ගමන් කිරීමට බලපත්‍රයක් දෙනු ලැබේ.

(17) පියාසර දීමනාව නියමු පොදු රාජකාරි ශාඛාව සඳහා ගෙවනු ලැබේ.

(18) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරීන්ට පහත සඳහන් පරිදි ගෙවල් කුලී දීමනාවන් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ගෲප් කැප්ටන් සහ ඉන් ඉහල නිලයන්ට මසකට රු. 1,600 සිට රු. 4,250 දක්වා වේ.

09. *විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා.*—වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප්/ පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. සියලුම නිලධාරීන් වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුව වේ.

10. *අයදුම්කරුවන්ට උපදෙස් :*

(අ) පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියළුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2011 ජූනි මස 24 වැනි දින දහවල් 12.00 ට ප්‍රථම ලැබෙන සේ "ප්‍රධාන ආධුනිකයන් බඳවා ගැනීමේ නිලධාරී, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයැදුම්පත් බාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ "ආධුනික ශිෂ්‍යභට නිලධාරී/ආධුනික කාන්තා ශිෂ්‍යභට නිලධාරී සඳහා ඉල්ලුම්පත ......... ශාඛාව " යනුවෙන් සටහන් කළ යුතුයි. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනයට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්, අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ/ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. :—

(1) උප්පැන්න සහතිකය (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය),

(2) අයදුම්කර ඇති ශාඛාවට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික,

(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික,

(4) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයැදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ වර්තමාන සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය,

(5) ක්‍රීඩා හා ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(ඈ) නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(ඉ) කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතුය.

(ඊ) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

11. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරාගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

12. *තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය :*

(අ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදුවන්නේය. ඉන් තෝරාගනු ලබන අපේක්ෂකයින්, ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණ සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින්හට පරීක්ෂණ පවත්වන දිනය, වේලාව හා ස්ථානය ලිඛිතව දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිම වියදමක් ගෙවනු නොලැබේ.

(ඇ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදී ම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

(ඉ) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම් නැතහොත් බලපෑම් කිරීමට උත්සහ කිරීම, අපේක්ෂකයා නුසුදුසු අයෙක් වීමට හේතු වන්නේය.

(ඊ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

(එච්. ඩී. අබේවික්‍රම),
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

කොළඹ 02,
තැපැල් පෙට්ටිය 594 හි
ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ දී ය.

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ආධුනික ශිෂ්‍යභට නිලධාරි/කාන්තා ශිෂ්‍යභට නිලධාරි සඳහා ඉල්ලුම්පත**

**ගුවන් හමුදාවේ ………… ශාඛාව**

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)
2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :————.
4. ස්ථිර ලිපිනය :————.
5. තැපැල් ලිපිනය :————.
6. උපන් දිනය :————.
වයස (2011 සැප්තැම්බර් මස 30 වැනි දිනට) :
අවුරුදු :————, මාස :————, දින :————.
7. උස :— අඩි :————, අඟල් :————.
8. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.
9. දිස්ත්‍රික්කය:————.
10. ඡන්ද කොට්ඨාසය :————.
11. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
12. දුරකථන අංකය :————.
13. විවාහක හෝ අවිවාහක බව :————.
14. ස්ත්‍රී, පුරුෂ භාවය :————.
15. පාසල් සහ/හෝ විශ්ව විද්‍යාල පිළිබඳ විස්තර :

| පාසලේ/විශ්ව විද්‍යාලයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව) |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ)<br>අ.පො.ස. (උ.පෙළ)<br>වෙනත් | | |

16. පාසලෙන්/විශ්ව විද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර :

| සේවායෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

17. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | දැන් ලිපිනය |
|---|---|---|---|
| පියා : | | | |
| මව : | | | |

18. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.
19. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න.) :————.
20. පාසලේ දී, විශ්ව විද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමඟ විස්තර දක්වන්න) :————.
21. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :————.
22. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න :————.
23. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.
24. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.
25. *චරිත සහතික පිළිබඳ විස්තර :*

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

26. *අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය ඃ*

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

27. *ඉල්ලුම්කරුගේ මව/පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය ඃ*

(අ) ඉහත අයදුම්පතේ 26 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ……………………………. නමැති අපේක්ෂකයාගේ මව/පියා/භාරකරු මම වෙමි.

(ආ) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි. :

(1) පුහුණුව ලබන කාල සීමාව තුළ දී පහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයත් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම,.

(2) විෂමාචාරය නිසා නැතහොත් ඔහුටම/ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අධිකාරියක් ලැබීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු/ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

————,
දෙමව්පිය/භාරකරුගේ අත්සන.

දිනය :————.

නම :————.
*(පැහැදිලි අකුරෙන්)*

ලිපිනය :————.

————,
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

නම :————.
*(පැහැදිලි අකුරෙන්)*

ලිපිනය :————.

————,
දෙවන සාක්ෂිකරුගේ අත්සන.

නම :————.
*(පැහැදිලි අකුරෙන්)*

ලිපිනය :————.

* *අදාල නොවන වචන කපා හරින්න.*

06-313

## ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි I පන්තියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 3 ඡේදයේ 2 වැනි වගන්තියෙහි සඳහන් විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාවේ පවත්නා පුරප්පාඩු සඳහා නිලධාරීන් උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අංක 1422/23, 1458/2 හා 1697/10 දරන පිළිවෙළින් 2005.12.09, 2006.08.14 හා 2011.03.16 දිනැතිව නිකුත් කළ *අති විශෙෂ ගැසට්* පත්‍රවල සංශෝධිත අංක 1419/3 හා 2005.11.14 දිනැති ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව 2005.01.01 දින සිට 2011.01.01 තෙක් කාලයට අදාළව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම 17(ඇ) වගන්තිය යටතේ සිදු කරනු ලැබේ.

03. *උසස් කිරීමේ ක්‍රමය.-*

3.1 පිරවීමට ඇති ඇබෑර්තු සංඛ්‍යාව මෙන් දෙගුණයකට වඩා වැඩි නොවන නිලධාරීන් සංඛ්‍යාවක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන සාමාජිකයින් 03 දෙනෙකුගෙන් සමන්විත වන මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

3.2 පහත 04 ඡේදයේ 4.1 හා 4.2 යටතේ දැක්වෙන 1 හා 2 කාණ්ඩ යටතේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගෙන් තනතුරු පුරප්පාඩුවලින් 80% ද, ඡේද 4.3 හා 4.4 යටතේ දැක්වෙන 3 හා 4 කාණ්ඩ යටතේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගෙන් තනතුරු පුරප්පාඩුවලින් 20% ද ජ්‍යෙෂ්ඨතාවය සහ කුසලතාව මත උසස් කිරීම මගින් පුරවනු ලැබේ.

ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය සලකා බැලීමේ දී සේවා ව්‍යවස්ථාවේ 14 (1) (ඈ) හෝ 19(1) (ආ) සුදුසුකම් උසස්වීම් දිනට හෝ අන්තර්කාලය තුළ සම්පූර්ණ කර තිබීම වීම කුසලතාවය වශයෙන් සලකනු ලැබේ. (අමප/11/0881/523/071 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය) ඒ අනුව කුසලතාවය ලබා ඇති නිලධාරීන්, උසස් වීමට පෙර ශ්‍රී ලං.ප.සේ. I පන්තියේ/ශ්‍රේණියේ පැවති ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙලින් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

3.3 ඒ අනුව එක් එක් උසස්වීම් දිනට අදාළ ජ්‍යෙෂ්ඨතා ලේඛනය, එම එක් එක් දිනයන්ට උසස් වීමට සුදුසුකම් ලැබූ නිලධාරීන් උසස් වීමට පෙර පැවති ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙලින් සැකසේ.

3.4 2005.01.01 දිනට අදාළව, සිදු කරන උසස්වීම් අංක අමප/09/1372/317/048 හා 2009.10.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සිදු කරනු ලැබේ.

04. *සුදුසුකම්.-* පහත කාණ්ඩ 4 අතුරින් ඕනෑම එක් කාණ්ඩයකට අදාළ සුදුසුකම් සපුරා තිබිය යුතුය :

4.1 *කාණ්ඩය 1 :* සේවා ව්‍යවස්ථාවේ 17 (ඇ) (1) යටතේ සුදුසුකම් ලබන නිලධාරීන් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා :

4.1.1 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ/පන්තියේ වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම. (ආයතන සංග්‍රහයේ V : 2,5,4, XII :16:9,XII :16 : 10 සහ XII :36 :1:4 (i) හා (ii) යන කොන්දේසි සහ විනය තීරණ වල

කොන්දේසි යටතේ වසර 5 ක කාල සීමාව ගණනය කළ යුතුය)

4.1.2 සේවා ව්‍යවස්ථාවේ 14(1) (ඈ) හෝ 19(1) (ආ) යටතේ වන සුදුසුකම් උසස්වීම් දිනට හෝ අන්තර්කාලය තුළ සම්පූර්ණ කර තිබීම.

4.1.3 උසස් වීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන දිනට පූර්වාසන්න වසර 5 තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම සහ විනයානුකූල දඬුවමකට ලක්ව නොතිබීම. (ආයතන සංග්‍රහයේ XII:16 :7 යටතේ ලබන වැටුප් වර්ධක උසස් වීම් සඳහා සලකා නොබලන බව ආයතන සංග්‍රහයේ XII:16 : 9 හි සඳහන් හෙයින් මෙහි දී අදාළ කර ගනු නොලැබේ).

4.1.4 4.1.3 හි සඳහන් කාල සීමාව තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයීම් අනුව වැඩ හා හැසිරීම යහපත් බවට නිර්දේශ කර තිබීම.

4.2 කාණ්ඩය 2 : සේවා ව්‍යවස්ථාවේ 17(ඇ) (I) සටහන 1 යටතේ සුදුසුකම් ලබන නිලධාරීන් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා :

4.2.1 2005.11.14 දිනට හෝ පෙර, විශේෂ ශ්‍රේණියේ තනතුරකට විධිමත් පත්වීමක් ලබා තිබීම.

4.2.2 2005.11.14 දිනට හෝ පෙර, සේවා ව්‍යවස්ථාවේ 14(1)(ඈ) සුදුසුකම් සපුරා තිබීම.

4.2.3 ඉහත 4.1.3 හා 4.1.4 අවශ්‍යතා සපුරා තිබීම.

4.3 කාණ්ඩය 3 : සේවා ව්‍යවස්ථාවේ 17 (ඇ) (ii) යටතේ සුදුසුකම් ලබන නිලධාරීන් සම්පූර්ණ කළ යුතු සුදුසුකම් :

4.3.1 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ/පන්තියේ වසර 10 ක සේවා කාලයක් සපුරා තිබීම. (ආයතන සංග්‍රහයේ V:2:5:4, XII :16:9, XII:16 :10 සහ XII :36 : 1: 4 (i) හා (ii) යන කොන්දේසි සහ විනය තීරණ වල කොන්දේසි යටතේ වසර 10 ක කාල සීමාව ගණනය කළ යුතුය.).

4.3.2 19(1)(ආ) යටතේ වන සුදුසුකම් සපුරා තිබීම හෝ අන්තර්කාලය තුළ එම සුදුසුකම් සම්පූරණ කර තිබීම.

4.3.3 සේවා ව්‍යවස්ථාවේ 14 (1) (ආ) යටතේ වන සුදුසුකම් සපුරා තිබීම.

4.3.4 ඉහත 4.1.3 හා 4.1.4 අවශ්‍යතා සපුරා තිබීම.

4.4 කාණ්ඩය 4 : සේවා ව්‍යවස්ථාවේ 17(ඇ) (ii) සටහන 2 යටතේ සුදුසුකම් ලබන නිලධාරීන් :

4.4.1 2005.11.14 දිනට හෝ පෙර විශේෂ ශ්‍රේණියේ තනතුරකට විධිමත්ව පත් කර තිබීම.

4.4.2 ඉහත 4.3.1, 4.3.3 හා 4.3.4 අවශ්‍යතා සපුරා තිබීම.

2005.01.01, 2005.07.01 හා 2006.01.01 දිනට ඉහත කාණ්ඩ 4 යටතේද, 2006.07.01, 2007.01.01, 2007.07.01, 2008.01.01, 2008.07.01, 2009.01.01,2009.07.01, 2010.01.01, 2010.07.01 හා 2011.01.01 යන දිනයන්ට ඉහත 1 හා 3 කාණ්ඩ යටතේ ද සුදුසුකම් ලබන නිලධාරීන් මේ සමග වන ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර අමාත්‍යාංශය ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත 2011.07.21 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. එදිනට පසුව එවන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලබන අතර සදොස්ව හා අසම්පූර්ණව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනට විශ්‍රාම ගෙන සිටියේ වුව ද 2005.01.01 දින තෙක් හෝ එදිනට පසු දිනයක් තෙක් සේවයේ යෙදී සිටි සහ උසස් වීමට ඉහත 4 ඡේදයේ කවර හෝ කාණ්ඩයක් යටතේ සුදුසුකම් සපුරා ඇති, පෙර උසස් වීම් අවස්ථාවේදී සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි නමුත් උසස් වීම් නොලද හෝ ඉල්ලුම් කිරීමට නොහැකි වූ නිලධාරීන් හට මෙම උසස් වීම් සඳහා ඉල්ලුම් කළ හැකිය.

ඉල්ලුම්පත www.pubad.gov.lk/publication-list.php ඔස්සේ ලබා ගත හැක.

අමාත්‍ය මණ්ඩලයේ නියෝග පරිදි,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2011 ජුනි මස 01 වැනි දින.

**ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි I පන්තියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත**

කාර්යාලයීය ප්‍රයෝජනය පිණිසයි.

| අයදුම්පත් අංකය : | S | |
|---|---|---|
| | F | |

(අ) කොටස - නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.

1. නම :
   1.1 සම්පූර්ණ නම :—————.මෙය./මිය/මයා.
   1.2 පත්වීම් ලිපියෙහි සඳහන් පරිදි නම :—————.

2. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

3. උපන් දිනය :—————.

4. පෞද්ගලික ලිපිනය :—————.

5. දුරකථන අංකය : 5.1 නිවස :—————. 5.2 ජංගම :—————.

6. 6.1 තනතුර :—————.
   (දැනට දරන/දැනට විශ්‍රාමික නම් විශ්‍රාම යන අවස්ථාවේ දී දැරූ)
   6.2 දැනට විශ්‍රාමික නම් විශ්‍රාම ගත් දිනය :—————.

7. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :—————.

8. කාර්යාලයීය ලිපිනය :—————.

9. 9.1 කාර්යාලයීය දුරකථන අංකය :—————. 9.2 කාර්යාලයීය ෆැක්ස් අංකය :—————.

10. පත්වීම් උසස්වීම් දින :————.

10.1 ශ්‍රී.ලං.ප.සේ II/II ශ්‍රේණියට (III පන්තියට) පත්වීම් දිනය :————.

10.2 ශ්‍රී. ලං. ප. සේ. II/I ශ්‍රේණියට (II පන්තියට) උසස් වූ දිනය :————.

10.3 ශ්‍රී. ලං. ප.සේ. I ශ්‍රේණියට (I පන්තියට) උසස් වූ දිනය :————.
(1 ශ්‍රේණියට/I පන්තියට උසස්වීම් ලිපියේ සහතික කළ පිටපත 10.3 වශයෙන් අංක කර ඇමිණිය යුතුය).

11. I පන්තියට උසස් වීමෙන් පසු සේවයේ නොසිටි කාලසීමාවන් සහ විනයානුකූල දඬුවම් ලැබීම මත සේවා කාලය අඩුවීම් :

11.1 නිවාඩු ලබා ගැනීම මත සේවා කාලය අඩුවීම (අදාළ වේ නම් පමණක් සම්පූර්ණ කරන්න) :—————.

| අනු අංකය | නිවාඩු අනුමැතිය සඳහා අදාළ කොන්දේසි | කාල සීමාව | | සේවා කාලය අඩු වන දින ගණන | | |
|---|---|---|---|---|---|---|
| | | සිට | දක්වා | අවු. | මාස | දින |
| i | ආයතන සංග්‍රහයේ V : 2.5.4 | | | | | |
| ii | ආයතන සංග්‍රහයේ XII :16 | | | | | |
| iii | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 10 | | | | | |
| iv | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 | | | | | |
| v | ආයතන සංග්‍රහයේ XII :36 | | | | | |
| vi | වෙනත් (වැටුප් රහිත නිවාඩු) | | | | | |
| සේවා කාලය අඩුවන සම්පූර්ණ දින ගණන | | | | | | |

(නිවාඩු අනුමත කළ ලිපිවල සහතික කළ පිටපත් 11. 1 i, 11 .1 ii, 11. 1 iii ආදී වශයෙන් කරුණට අදාළව අංක කර ඇමිණිය යුතුය).

11.2 විනය කරුණු මත සේවා කාලය අඩු වීම (අදාළ වේ නම් පමණක් සම්පූර්ණ කරන්න) :—————.

| විනය තීරණය | චෝදනා පත්‍රය අනුව වරද සිදු වූ කාල සීමාව | සේවා කාලය අඩුවන දින ගණන | | |
|---|---|---|---|---|
| | | අවු | මාස | දින |
| i. වැටුප් වර්ධක ..... ක් විලම්භනය කිරීම | | | | |
| ii. වෙනත් | | | | |
| සේවා කාලය අඩුවන සම්පූර්ණ දින ගණන | | | | |

(විනය තීරණවල සහතික කළ පිටපත් 11.2 i, 11.2 ii, 11.2. iii ආදී වශයෙන් කරුණට අදාළව අංක කර ඇමිණිය යුතුය.)

11.3 11.1 හා 11.2 හි මුළු එකතුව : අවු:————, මාස:———, දින:———.

11.4 I පන්තියට පත් වූ දිනෙන් ඉදිරියට ඉහත 11.3 හි කාල සීමාව ඉවත් කළ විට දිනය :————.

12. උසස් වීමට ඉල්ලුම් කළ හැකි දිනය :————.
(2005.01.01, 2005.07.01, 2006.01.01 2006.07.01, 2007.01.01, 2007.07.01, 2008.01.01, 2008.07.01, 2009.01.01, 2009.07.01, 2010.01.01, 2010.07.01 හා 2011.01.01 දින අතරින් කවර දිනය ද යන වග) :————.

12.1 *කාණ්ඩය 1 :* ඉහත 11.4 දිනය සිට වසර 5 ක් සම්පූර්ණ වන දිනට පසුව එන ආසන්නතම උසස් වීම් දිනය හෝ 11.4 අදාළ නොවේ නම් I පන්තියට/ශ්‍රේණියට පත් වූ දින සිට වසර 5 සම්පූර්ණ කරන දිනය වේ.

12.2 *කාණ්ඩය 2 :* 2005.01.01 හෝ විශේෂ ශ්‍රේණියේ තනතුරකට විධිමත්ව පත්වීම ලැබූ දිනට පසුව එන ආසන්නතම උසස්වීම් දිනය වේ.

විශේෂ ශ්‍රේණියේ තනතුරට පත් කළ දිනය :

*(අ)* 2005.01.01 දිනට පෙර දිනයක් නම්, ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන දිනය 2005.01.01 වේ.

*(ආ)* 2005.01.01 - 2005.11.14 අතර නම් එදිනට පසුව එන ආසන්නම උසස්වීම් දිනය එනම් 2005.07.01 හෝ 2006.01.01 වේ.

(2005.11.14 දිනට පසුව විශේෂ ශ්‍රේණියේ තනතුරකට කරන ලද පත්වීම් මෙම කාණ්ඩය යටතට නොගැනේ.)

12.3 *කාණ්ඩය 3 :* ඉහත 11.4 දින සිට වසර 10 ක් සම්පූර්ණ කරන දිනට පසුව එන ආසන්නතම උසස්වීම් දිනය හෝ 11.4 අදාළ නොවේ නම් I පන්තියට/ශ්‍රේණියට පත් වූ දින සිට වසර 10 සම්පූර්ණ කරන දිනය වේ.

12.4 *කාණ්ඩය 4 :* 2005.01.01 හෝ විශේෂ ශ්‍රේණියේ තනතුරකට විධිමත්ව පත්වීම ලැබූ දිනට පසුව එන ආසන්නතම උසස්වීම් දිනය වේ.

විශේෂ ශ්‍රේණියේ තනතුරට පත් කළ දිනය :

*(අ)* 2005.01.01 දිනට පෙර දිනයක් නම්, ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන දිනය 2005.01.01 වේ.

*(ආ)* 2005.01.01 - 2005.11.14 අතර නම් එදිනට පසුව එන ආසන්නතම උසස්වීම් දිනය, එනම් 2005.07.01 හෝ 2006.01.01 වේ.

(2005.11.14 දිනට පසුව විශේෂ ශ්‍රේණියේ තනතුරකට කරන ලද පත්වීම් මෙම කාණ්ඩය යටතට නොගැනේ.).

12:5 *ගැසට් නිවේදනයේ 4 ඡේදය අනුව සුදුසුකම් ලබන කාණ්ඩය :————.*

ඉහත පැහැදිලි කිරීම් අනුව ඉල්ලුම් කළ හැකි දිනය :—————.

13. *පූර්වාසන්න පස් වසර තුළ වැටුප් වර්ධක ලබා තිබීම :*

13:1 ඉහත 12.5 අනුව උසස් වීමට සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර 05 තුළ සියළු වැටුප් වර්ධක **උපයාගෙන තිබේ/නැත* (ආයතන සංග්‍රහයේ XII :16 :9, XII :16 :10 සහ XII :36:1:4 (i) හා (ii) යටතේ ලබා ඇති වැටුප් වර්ධක උසස් වීම් සඳහා පිළිගනු නොලැබේ.).

* (අදාළ නොවන වචනය කපා හරින්න).

13.2. 12.5 හි සඳහන් දිනට පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක ලබා නොමැති නම් වැටුප් වර්ධක 05 ලබන දින තෙක් උසස් වීමට සුදුසුකම් ලබන දිනය නැවත ගණනය කළ යුතුය. ඒ අනුව සුදුසුකම් ලබන දිනය** :——————.

** (වැටුප් වර්ධක පත්‍රිකාපහේ (05) සහතික කළ පිටපත් 13.1 සිට 13.5 දක්වා අංක කර අමුණන්න)

13. *පූර්වාසන්න වසර 05 තුළ විනයානුකූල දඬුවමකට භාජනය වී නොතිබීම :*

14.1 ගොනුව අනුව, ඉහත 12.5 යටතේ සඳහන් උසස්වීම් දින හෝ 13.2 යටතේ සංශෝධිත දිනයට පූර්වාසන්න වසර 05 තුළ කිසිදු විනය දඬුවමකට ලක් වී නොමැත. (දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මේ බව ලිඛිත ප්‍රකාශයකින් සහතික කළ යුතුය. ඉල්ලුම්පතෙහි "ආ" කොටස යටතේ).

14.2 14.1 හි සඳහන් කාලසීමාව තුළ විනය දඬුවමකට ලක්ව ඇති අතර 11.2 යටතේ කරුණු සඳහන් කර ඇත්නම් සහ ඒ අනුව 12.5 යටතේ සඳහන් දිනය සංශෝධනය වේ නම් එම දිනය :——————.

14.3 12.5 යටතේ සඳහන් දිනය 13.2 හා 14.2 අනුව සංශෝධනය වේ නම් නව සංශෝධිත දිනය :——————.

15. *පූර්වාසන්න පස් වසර තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයුම අනුව වැඩ, හැසිරීම යහපත් බව පිළිබිඹු වීම :*

ඉහත 12.13 හෝ 14 අනුව සුදුසුකම් ලබන දිනට අදාළ වර්ෂයට පූර්වාසන්න වර්ෂ 05 පහත වගුවෙහි පළමු තීරුවේ සටහන් කළ යුතුයි. අදාල කාර්ය සාධන වාර්තා 05 හි සහතික කළ පිටපත් ඇමිණිය යුතුය. කාර්ය සාධන වාර්තාවේ අවසාන ඇගයුමෙහි විකල්ප නිර්දේශ එකකට වඩා දක්වා ඇති සහ අදාළ නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව තබා නොමැති වාර්තා පිළිගනු නොලැබේ.

| *වර්ෂය* | *අවසාන ඇගයුම විශිෂ්ඨයි/සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි/සතුටුදායකයි/ අසතුටුදායකයි* | *අදාළ නිලධාරියා අත්සන් තබා, මුද්‍රා තබා ඇත/නැත* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

එක් එක් වර්ෂයේ කාර්ය සාධන වාර්තාව අනුව සෑම පේළියක් හා තීරුවක්ම සම්පූර්ණ කළ යුතුය.

16. *සේවා ව්‍යවස්ථාවේ 14 (ඇ) සුදුසුකම සම්පූර්ණ කර තිබීම (අදාළ වන්නේ නම් සම්පූර්ණ කරන්න) :*

| 16.1 අනු. අංකය | 16.2 පශ්චාත් උපාධියේ නම | 16.3 විෂය ක්ෂේත්‍රය | 16.4 එම උපාධිය පිරිනමන ලද විශ්ව විද්‍යාලය | 16.5 එම විශ්ව විද්‍යාලය, විශ්ව විද්‍යාලයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළගෙන තිබේද යන වග | 16.6 උපාධි කාල සීමාව (ආරම්භක හා අවසාන දිනය) | 16.7 උපාධිය වලංගු දිනය |
|---|---|---|---|---|---|---|
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |
| 5. | | | | | | |

(16.1 වශයෙන් අංක යොදා උපාධි සහතිකය සහ විස්තරාත්මක ප්‍රතිඵල සටහනෙහි සහතික කළ පිටපත් ඇමිණිය යුතුය.)

17. සේවා ව්‍යවස්ථාව 19(1)(ආ) සුදුසුකම සම්පූර්ණ කර තිබීම. (අදාළ වන්නේනම් සම්පූර්ණ කරන්න) :

17:1 නිබන්ධනයේ මාතෘකාව :——————.

17:2 නිබන්ධනය සම්පූර්ණ කළ (වලංගු) දිනය :——————.

(සම්පූර්ණ කළ බවට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් නිකුත් කළ සහතිකයේ සහතික කළ පිටපත අංක 17.1 වශයෙන් අංක යොදා ඇමිණිය යුතුය.)

18. විශේෂ ශ්‍රේණියේ තනතුරකට පත් කර තිබීම (අදාළ වන්නේනම් සම්පූර්ණ කරන්න) :

| *18.1 අනු. අංකය* | *18.2 කාල සීමාව* | *18.3 තනතුරු නාමය සහ සේවා ස්ථානය* | *18.4 පත්වීම පිරිනමා ඇත්තේ අමාත්‍ය මණ්ඩලය/ ආණ්ඩුකාරතුමන්/ රාජ්‍ය සේවා කොමිෂන් සභාව* | *18.5 පත්වීමේ ස්වභාවය රාජකාරි ඉටු කිරීම/වැඩ බැලීම/නිත්‍ය/ කොන්ත්‍රාත්* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

(සියළුම පත්වීම් ලිපිවල සහතික කළ පිටපත් 18:1, 18:2 වශයෙන් අංක යොදා ඇමිණිය යුතුය).

ඉහත 16, 17 හා 18 අතුරින් අදාළ වන කරුණු සඳහා පිළිතුරු සපයන්න.

ඉහත අංක 01 සිට 18 තෙක් නිරවද්‍ය හා සම්පූර්ණ තොරතුරු සහිත ඉල්ලුම්පත සහ අමුණා එවන ලෙස සඳහන් කර ඇති සියළු ලේඛනවල සහතික කළ පිටපත් කරුණට අදාළ අංකය එක් එක් ලේඛනයේ දකුණු ඉහළ කෙළවරෙහි සටහන් කර **අංක පිළිවෙලින් අමුණා ගොනුවක් වශයෙන් සකස් කර** මේ සමග ඉදිරිපත් කරමි.

―――――――,
ඉල්ලුම්කරුගේ අත්සන,
තනතුරු නාමය සහ නිල මුද්‍රාව.

දිනය :―――――.

*(ආ) කොටස ඃ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුයඃ*

ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය/අදාළ අමාත්‍යාංශය,

1. නිලධාරියා ඉහත සඳහන් කර ඇති සියලු කරුණු නිවැරදිය.

2. අංක 11, 13, 14 හා 18 ට අදාළ කරුණු ගොනුව අනුව සසඳා බලන ලදී. සඳහන් කර ඇති කරුණු නිවැරදි බව ද සියළු තොරතුරු සම්පූර්ණව ඉදිරිපත් කර ඇති බව ද අදාළ සියළු ලේඛනවල සහතික කළ පිටපත් අමුණා ඉදිරිපත් කර ඇති බව ද සහතික කරමි.

3. නිලධාරියාට එරෙහිව විනය කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් හෝ විනය පරීක්ෂණ සිදු වෙමින් පවතියි/ නොපවතියි.

   3:1 ඉහත පිළිතුර "පවතියි" නම් වරද කළ දිනය :―――――.

   3:2 විනය බලධාරියා විසින් චෝදනා පත්‍රය නිකුත් කළ දිනය :―――――.

4. ..................................... මහතා/මහත්මිය/මෙනෙවිය හෝ රාජකාරි/පැමිණීම/හැසිරීම සතුටුදායකය. ඔහුගේ/ඇයගේ කාර්යසාධනය, නායකත්වය, හැකියාව හා ඊළඟ උසස්වීමට අදාළව තනතුරු හා වගකීම් දැරීමේ හැකියාව සලකා බැලිමි. ඔහු/ඇය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

5. නිවැරදිව, අනුනව සම්පූර්ණ කළ අයදුම්පත ද, එක් එක් කරුණට අදාළ අංකය සටහන් කරමින් අංක පිළිවෙලින් අදාළ ලේඛනවල සහතික කළ පිටපත් ද අමුණා සකස් කරන ලද ගොනුව මේ සමග එවමි.

―――――――,
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන, තනතුරු නාමය,
සහ නිල මුද්‍රාව.

දිනය :―――――.

*සටහන.- නොගැලපෙන වචන කපාහරින්න.*

*(ඇ) කොටස - අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් සම්පූර්ණ කළ යුතුය ඃ-*

ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,

1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ...................................... මහතා/මහත්මිය/මෙනවියගේ රාජකාරි හා හැසිරීම පිළිබඳව දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සමග එකඟ වෙමි/එකඟ නොවෙමි.

2. නිලධාරියාගේ රාජකාරි/හැසිරීම/විශේෂ කුසලතා හා කාර්ය සාධනය අගැයීමට ලක් කළෙමි.

   ............................................................. මහතා/මහත්මිය/මෙනෙවිය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි/නොකරමි*

   (*නිර්දේශ නොකරන්නේනම් හේතුව කෙටියෙන් සඳහන් කරන්න.)

3. නිවැරදිව, අනුනව සම්පූර්ණ කළ අයදුම්පතද, එක් එක් කරුණට අදාළ අංකය සටහන් කරමින් අංක පිළිවෙලින් අදාළ ලේඛනවල සහතික කළ පිටපත් ද අමුණා සකස් කරන ලද ගොනුව ද මේ සමග එවමි.

―――――――,
ලේකම්
―――――――,
――――― අමාත්‍යාංශය,

නිල මුද්‍රාව

දිනය :―――――.

06-353

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
කොළඹ දිස්ත්‍රික්කය

**2011 වසර දෙවන අර්ධය සඳහා ආධුනික ආධුනිකාවන් බඳවා ගැනීම**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ කොළඹ දිස්ත්‍රික්කය තුළ ඇති පහත සඳහන් මධ්‍යස්ථානවල පැවැත්වෙන පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනික ආධුනිකාවන් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

| අංකය | මධ්‍යස්ථානය | පාඨමාලාව | පාඨමාලා ස්වභාවය NVQ/ Non NVQ | කාලය (මාස) ආයතනික | කාලය (මාස) කර්මාන්තගත | අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් | පාඨමාලා ගාස්තුව රු. |
|---|---|---|---|---|---|---|---|
| 01. | රාජගිරිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, | සූපවේදී | NVQL 3 | 06 | 06 | අ. පො. ස. (සා. පෙ.) පෙනී සිටීම | 1,000 0 |
| | අංක 03, සරණ පාර, | රූපලාවන්‍ය ශිල්පී | NVQL 4 | 03 | 03 | 09 වසර සමත් වීම | 10,000 0 |
| | රාජගිරිය | කොණ්ඩා සැකසුම් ශිල්පී | NVQL 4 | 03 | 03 | 09 වසර සමත්වීම | 15,000 0 |
| | | පරිගණක දෘඩාංග | NVQL 3 | 06 | 06 | අ. පො. ස. (සා. පෙ.) ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය සම්මාන සහිතව විෂයන් 06කින් සමත්වීම | 6,000 0 |
| 02. | සීතාවක වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, | අධිවේගී මහන යන්ත්‍ර- ක්‍රියාකරු | NVQL 4 | 03 | 03 | 09 වසර සමත්වීම | නොමිලේ |
| | සීතාවක කර්මාන්තපුරය, අවිස්සාවේල්ල | මෝටර් රථ විදුලි කාර්මික | NVQL 4 | 18 | 12 | අ. පො. ස. (සා. පෙ.) විෂයයන් 06කින් සමත්වීම | 6,000 0 |
| 03. | එළමලවල වෘ. පු. ම., | පෑස්සුම් ශිල්පී | NVQL 3 | 06 | 06 | 09 වසර සමත්වීම | නොමිලේ |
| | තුම්මෝදර, | විදුලි ශිල්පී | NVQL 3 | 06 | 06 | අ. පො. ස. (සා. පෙ.) පෙනී සිටීම | නොමිලේ |
| | එළමලවල | ජලනල කාර්මික ශිල්පී | NVQL 3 | 06 | 06 | 09 වසර සමත්වීම | නොමිලේ |
| 04. | පාදුක්ක වෘ. පු. ම., | ඇඳුම් මැසීම (කාන්තා) | NVQL 4 | 06 | 06 | 09 වසර සමත්වීම | 1,000 0 |
| | ගලගෙදර, | ඇළුමිණියම් පිරිසැකසුම්කරු | NVQL 3 | 06 | 06 | 09 වසර සමත්වීම | 1,000 0 |
| | පාදුක්ක | බේකරි ශිල්පී | NVQL 3 | 06 | 06 | 09 වසර සමත්වීම | 2,500 0 |
| | | ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී සහතික පත්‍ර පාඨමාලාව | Non NVQ | 06 | 06 | අ. පො. ස. (සා. පෙ.) ඉංග්‍රීසි, විද්‍යාව, සම්මාන සහිතව විෂයන් 06කින් සමත්වීම | 6,000 0 |
| 05. | පන්නිපිටිය වෘ. පු. ම., | ඇඳුම් මැසීම (පිරිමි) | NVQL 4 | 06 | 06 | 09 වසර සමත්වීම | 1,000 0 |
| | Y. M. B. A. | රූපලාවන ශිල්පී | NVQL 4 | 06 | 06 | 09 වසර සමත්වීම | 6,000 0 |
| | ගොඩනැගිල්ල, | කොණ්ඩා සැකසුම් ශිල්පී | NVQL 4 | 06 | 06 | 09 වසර සමත්වීම | 9,000 0 |
| | පන්නිපිටිය | තොරතුරු තාක්ෂණ ශිල්පී | NVQL 4 | 06 | 06 | අ. පො. ස. (සා. පෙ.) ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය සම්මාන සහිතව විෂයන් 06කින් සමත්වීම | 6,000 0 |
| 06. | හොන්නන්තර වෘ. පු. ම. ශ්‍රී | තොරතුරු තාක්ෂණ ශිල්පී | NVQL 4 | 06 | 06 | අ. පො. ස. (සා. පෙ.) ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය සම්මාන සහිතව විෂයන් 06කින් සමත්වීම | 6,000 0 |
| | විජයනන්දනාරාමය, | විදුලි ශිල්පී | NVQL 3 | 06 | 06 | අ. පො. ස. (සා. පෙ.) පෙනී සිටීම | නොමිලේ |
| | හොන්නන්තර, පිළියන්දල | සූපවේදී | NVQL 3 | 06 | 06 | 09 වසර සමත්වීම | 1000 0 |
| 07. | කළුබෝවිල වෘ. පු. ම, අංක 64, | ඇඟළුම් තත්ත්ව පාලක | NVQL 4 | 06 | 06 | අ. පො. ස. (සා. පෙ.) විෂයයන් 06කින් සමත්වීම | නොමිලේ |
| | ප්‍රතිබිම්බාරාම පාර, | රූපලාවන්‍ය ශිල්පී | NVQL 4 | 03 | 03 | 09 වසර සමත්වීම | 6,000 0 |
| | කළුබෝවිල, දෙහිවල | කොණ්ඩා සැකසුම් ශිල්පී | NVQL 4 | 03 | 03 | 09 වසර සමත්වීම | 9,000 0 |
| 08. | වැල්ලවත්ත වෘ. පු. ම. | සූපවේදී | NVQL 3 | 06 | 06 | අ. පො. ස. (සා. පෙ.) පෙනී සිටීම | 500 0 |
| | අංක 48, | විදුලි ශිල්පී | NVQL 3 | 06 | 06 | අ. පො. ස. (සා. පෙ.) විෂයයන් 06කින් සමත්වීම | නොමිලේ |
| | බෝධිරුක්ඛාරාම පාර, | කොණ්ඩා කැපුම් ශිල්පී (පිරිමි) | Non NVQ | 06 | 06 | 09 වසර සමත්වීම | නොමිලේ |
| | වැල්ලවත්ත | තොරතුරු තාක්ෂණ ශිල්පී | NVQL | 06 | 06 | අ. පො. ස. (සා. පෙ.) ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය සම්මාන සහිතව විෂයන් 06කින් සමත්වීම | 6,000 0 |
| | | කාර්යාල උපකරණ අළුත්වැඩියා කරන්නා | Non NVQ | 06 | 06 | අ. පො. ස. (සා. පෙ.) පෙනී සිටීම | 5,000 0 |

| අංක | මධ්‍යස්ථානය | පාඨමාලාව | පාඨමාලා ස්වභාවය NVQ/ Non NVQ | කාලය (මාස) ආයත-නික | කාලය (මාස) කර්මාන්ත-ගත | අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් | පාඨමාලා ගාස්තුව රු. |
|---|---|---|---|---|---|---|---|
| 09 | කෝට්ටේ වෘ. පු. ම (නිපොන්) මහින්දාරාම පාර, ඇතුල්කෝට්ටේ | තොරතුරු තාක්‍ෂණ ශිල්පී | NVQL | 06 | 06 | අ. පො. ස. (සා. පෙ.) ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය සම්මාන සහිතව විෂයන් 06කින් සමත්වීම | 6,000 0 |
| 10 | ගොතටුව වෘ. පු. ම. ගොතටුව නව නගරය, මුල්ලේරියාව | ස්වර්ණාභරණ ගල් අල්ලන්නා | NVQL 3 | 06 | 06 | 09 වසර සමත්වීම | 2,000 0 |
| | | පැස්සුම් ශිල්පී | NVQL 3 | 06 | 06 | 09 වසර සමත්වීම | නොමිලේ |
| | | අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු | NVQL 3 | 03 | 03 | 09 වසර සමත්වීම | නොමිලේ |
| 11 | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ල, මහාමේස පෙදෙස, මහරගම | ඇඳුම් මැසීම | NVQL 4 | 06 | 06 | 09 වසර සමත්වීම | 1,000 0 |
| | | තොරතුරු තාක්‍ෂණ ශිල්පී | NVQL 4 | 06 | 06 | අ. පො. ස. (සා. පෙ.) ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය සම්මාන සහිතව විෂයයන් 06කින් සමත්වීම | 6,000 0 |
| | | | NVQL 4 | 03 | 03 | | |
| | | රූපලාවන්‍ය ශිල්පී | NVQL 4 | 03 | 03 | 09 වසර සමත්වීම | 6,000 0 |
| | | කොණ්ඩා සැකසුම් ශිල්පී | | | | 09 වසර සමත්වීම | 9,000 0 |

පාඨමාලා හදාරන්නන් සඳහා ලැබෙන ප්‍රතිලාභ :

* ජාත්‍යන්තරව පිළිගත් NVQ සහතිකය
* ආයතනික පුහුණුවෙන් පසු ඉහළ දීමනාවක් සමග වැඩිදුර පුහුණුව
* ස්වයං රැකියා සඳහා ව්‍යවසායකත්ව පුහුණුව සමග මූල්‍යාධාර පහසුකම්
* පුහුණුවෙන් පසු අනිවාර්ය දෙස් විදෙස් රැකියාගත කිරීම
* ව්‍යවසායකත්ව දැනුම
* ශිල්පීය ප්‍රවර්ධන දැනුම
* වෘත්තීය උපදේශන සේවාව සහ ඉංග්‍රීසි දැනුම
* ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය ( NVQ ) මට්ටම් 3 හා 4 ලබා ගැනීමෙන් පසු ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා හා තාක්‍ෂණ උපාධිය ලබා ගැනීමේ අවස්ථාව
* විශේෂ වූ පාඨමාලා කිහිපයක් සඳහා මාසික දීමනා
* ව්‍යාපාර උපදේශන සේවා
* NVQ පාඨමාලා නිපුණතා පාදක පුහුණුව (CBT) යටතේ හැදෑරීම
* ක්‍ෂේත්‍රයේ ශිල්පීය නිපුණතාවය වර්ධනය කිරීමේ වැඩමුළු
* පෞරුෂ වර්ධන වැඩසටහන්

පාඨමාලා සඳහා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2011.06.30 දින වේ.

ඔබ විසින් සකස්කරන ලද අයදුම්පත් ඉහත දිනට පෙර පහත සඳහන් ලිපිනයට යොමු කරන මෙන් දන්වමි.

සහකාර අධ්‍යක්‍ෂ,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
දිස්ත්‍රික් කාර්යාලය,
මහාමේස පෙදෙස, මහරගම.

දුරකථන අංකය : 011-2844151.

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

06-220

"ජීවිතයට හැකියාවක් හැකියාවට රැකියාවක්"

## ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2011

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් වෛද්‍ය නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් පැවැත්වීමට කටයුතු යොදා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය කොළඹ දී පැවැත්වේ.

1. ආයුර්වේද කොමසාරිස් විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

2. ඉල්ලුම් පත්‍ර මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතිවලට යටත් වේ. එම ආදර්ශ ආකෘතිය අනුව ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවට අදාළව සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කළයුතු අතර, එම අයදුම්පත්‍රය අපේක්ෂකයින් විසින් සිය ආයතන ප්‍රධානියා මගින් 2011.08.01 දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේඛකාධිකාරී, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2011" යනුවෙන් සඳහන් විය යුතු ය. අයදුම්පත්‍ර කැඳවන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමුවරට මෙම විභාගයට පෙනීසිටීමට කිසිදු ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත්, ඉන්පසු වාරවල දී නිලධාරීන් විසින් එකවර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රුපියල් 200 ක් වටිනා මුද්දර ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම්, රු. 50 ක් බැගින් වටිනා මුද්දර ද අයදුම්පතෙහි අලවා තම අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතු ය. මොනම කරුණක් යටතේ වුව ද එම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

3. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය* :
අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී සහ පෙනී සිටින සෑම විෂයයක් පාසාම ආයුර්වේද දෙපාර්තමේන්තුව සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතරින් කුමක් වුවත් භාරගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය.
(ii) වලංගු විදේශීය ගමන් බලපත්‍රය.

4. අයදුම්පත් පිළිගන්නා ලද නිලධාරීන් වෙත ආයුර්වේද කොමසාරිස් විසින් විභාග කාල සටහන සහ ප්‍රවේශ පත්‍රය නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් අත්සන නියමිත පරිදි සහතික කරවාගන්නා ලද ප්‍රවේශ පත්‍රය ආයුර්වේද දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. යම්කිසි නිලධාරියෙකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතකට පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත් ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව පහත සඳහන් විස්තර සමඟ "ලේඛකාධිකාරී, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම" යන ලිපිනයට වහාම දැන්විය යුතු ය.

(i) විභාගයේ නම :————.
(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(iii) අයදුම්කරුගේ ලිපිනය :————.
(iv) අයදුම් පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලයේ නම සහ ලියාපදිංචි අංකය :————.

5. *විභාග පරිපාටිය* :
(ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් සේවා ව්‍යවස්ථාවට අනුකූලව.)

I. *මුදල් රෙගුලාසි.*—පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්.

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ I වැනි කාණ්ඩය (10 පරිච්ඡේදය හැර)

II. *ආයතන සංග්‍රහය.*—පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්. :

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ පළමුවැනි කාණ්ඩයේ I, II, III, IV, V, VI, VII, VIII, XII, XIII, XIV, XXIII, XXVII, XXIX, XXX, XXXII පරිච්ඡේද සහ,

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දෙවැනි කාණ්ඩයේ XLVII සහ XLVIII පරිච්ඡේද.

III. *ආරෝග්‍යශාලා පරිපාලනය.*—පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්.

(i) ආරෝග්‍යශාලා පිළිබඳ බලපැවැත්වෙන සාමාන්‍ය නීතිරීති.
(ii) ආරෝග්‍යශාලා පිරිසිදුව තබා ගැනීම
(iii) රෝගීන් සම්බන්ධව බලපැවැත්වෙන නීතිරීති.
(iv) රෝගීන්ට නියමිත ආහාරපාන ලබාගන්නා විධි.
(v) ඖෂධ නිෂ්පාදනාගාර පාලනය
(vi) රෝගීන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් බලපැවැත්වෙන නීතිරීති
(vii) ආරෝග්‍යශාලාවල වෛද්‍ය අධිකාරීගේ සිට අනෙකුත් කණිෂ්ඨ සේවකයින් දක්වා ඔවුන්ට අයත් රාජකාරි පිළිබඳව ඇති අවබෝධය
(viii) ආරෝග්‍යශාලාවල සාමාන්‍ය පාලන කටයුතු
(ix) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පාලන රෙගුලාසි
(x) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම් පිළිබඳ නීතිරීති
(xi) ආයුර්වේද කාර්ය සංවිධාන සංග්‍රහය.

IV. *රාජ්‍ය භාෂා වාචික පරීක්ෂණය.*—සිංහල/දෙමළ (විනාඩි 15)

(i) සිංහල භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුනු නිලධරයන් සඳහා;

(අ) දෙමළ භාෂාවෙන් අසන ප්‍රශ්නවලට දෙමළ භාෂාවෙන් පිළිතුරු දීම,

(ආ) දෙමළ භාෂාවෙන් අසන වාක්‍ය සිංහල භාෂාවෙන් ප්‍රකාශ කිරීම,

(ඇ) සිංහල භාෂාවෙන් අසන වාක්‍ය දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කිරීම.

(ii) දෙමළ භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයන් සඳහා;
(අ) සිංහල භාෂාවෙන් අසන ප්‍රශ්නවලට සිංහල භාෂාවෙන් පිළිතුරු දීම,

(ආ) සිංහල භාෂාවෙන් අසන වාක්‍ය දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කිරීම,

(ඇ) දෙමළ භාෂාවෙන් අසන වාක්‍ය සිංහල භාෂාවෙන් ප්‍රකාශ කිරීම.

විභාගය සමත්වීම සඳහා එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු 40ක් ලබාගත යුතු ය.

පී. එස්. කේ. ආර්. වීරකෝන්,
ආයුර්වේද කොමසාරිස්,
ආයුර්වේද දෙපාර්තමේන්තුව.

2011 මැයි මස 27 වැනි දින,
ආයුර්වේද දෙපාර්තමේන්තුව,
නාවින්න,
මහරගම.

ආදර්ශ අයදුම්පත්‍රය

**ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2011**

විභාග අංකය [ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි.)

විභාගයට පෙනී සිටින මාධ්‍යය [ ]
(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)
සිංහල - S , දෙමළ - T

01. මුලකුරු සමඟ නම (MR./MRS./MISS) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. මුලකුරු සමග නම :————. (මයා/මිය/මෙය.)
(සිංහලෙන්/දෙමළෙන්)

03. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

04. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(සිංහලෙන්/දෙමළෙන්)

05. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

06. සේවා ස්ථානය හා ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

07. සේවා ස්ථානය හා ලිපිනය : (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.

08. දැනට දරන තනතුර :
(i) තනතුර :————.
(ii) පත්වීම් ලිපියේ අංකය හා දිනය :————.

09. ඔබ දැන් ඉදිරිපත්වන විෂයය/විෂයයන්.

| අනු අංකය | විෂයය | විෂයය අංකය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

10. ඔබ මින් ඉහත විභාගයක දී පහත සඳහන් විෂයයන් එකකින් හෝ කිහිපයක් හෝ සමත්වී තිබේ ද? මුදල් රෙගුලාසි/ආයතන සංග්‍රහය/ආරෝග්‍යශාලා පරිපාලනය/වාචික පරීක්ෂණය (දෙමළ/සිංහල)/එසේ නම් විභාග අංකය සහ දිනය සඳහන් කරන්න. :————.

11. ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථමවතාවට ද? :————.

විභාගයට පෙනී සිටින්නේ ප්‍රථමවතාවට නොවේ නම් අලවන මුද්දරවල වටිනාකම, මුද්දර කොටුව.

| සම්පූර්ණ විභාගය සඳහා රු. 200ක් වටිනා මුද්දර ද, එක් එක් විෂයයක් සඳහා නම් රු. 50ක් බැගින් වටිනා මුද්දර ද මෙහි අලවන්න. |
|---|

*සංලක්ෂය :* අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නියමිත වටිනාකමින් යුත් මුද්දර ඔහුගේ/ඇයගේ අත්සන සහ දිනය යොදා අවලංගු කළ යුතු යි. මුද්දර එක පිට එක නොඇලවිය යුතු ය.

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. මෙහි අලවා ඇති රු. ............ ක මුද්දර පාවිච්චි නොකරන ලද වලංගු ඒවා බවත්, සහතික කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීති පිළිබඳව මම එකඟ වෙමි.

————.
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

*සටහන*.—තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

***අත්සන සහතික කිරීම***

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ........................................ මහතා/මහත්මිය/මෙනෙවිය ........................වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

————.
සහතික කරන්නාගේ අත්සන සහ නිලමුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

06-335

### රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

### රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියේ නිලධාරීන් සඳහා වන පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණය සහ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010 (I) (2011)

1.0 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියේ නිලධාරීන් සඳහා අදාළ අනුමත සේවා ව්‍යවස්ථාවන්හි විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් සහ පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණයක් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2011 සැප්තැම්බර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 මෙම විභාගයට අදාළ වන අයදුම්කරුවන් පිළිබඳව අංක 1372/23 සහ 2004.12.24 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාවේ 05 වැනි සහ 09 වැනි වගන්තිවල තොරතුරු දක්වා ඇත.

3.0 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියේ නිලධාරීන් සඳහා මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුරය, බදුල්ල, රත්නපුරය හා කිලිනොච්චිය යන නගරවල දී පැවැත්වේ. අදාළ නගර හා නගර අංක පහතින් දැක්වේ. ඉල්ලුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. :-

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| මාතර | 04 |
| යාපනය | 05 |
| මන්නාරම | 06 |
| මුලතිව් | 07 |
| ත්‍රිකුණාමලය | 08 |
| මඩකලපුව | 09 |
| කුරුණෑගල | 10 |
| අනුරාධපුරය | 11 |
| බදුල්ල | 12 |
| රත්නපුරය | 13 |
| කිලිනොච්චිය | 14 |

ඉහත යම්කිසි මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර ඊට ආසන්න මධ්‍යස්ථානයක් වෙත අදාළ අයදුම්කරුවන් යොමු කෙරෙනු ඇත.

4.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති *ගැසට් නිවේදනයේ* වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

5.0 ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2011 ජූලි මස 18 දින හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

6.0 *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*—අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අනන්‍යතාව විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

7.0 *අයදුම්පත්‍ර.*—අංක 1.0 සිට 5.0 දක්වා ඡේදයන් පළමුවැනි පිටුවට ද ඉතිරිය දෙවැනි පිටුවට ද, ඇතුළත් වන පරිදි 'ඒ 4' ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය පිළියෙළ කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත්අකුරින් ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම

සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තවද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේනම් විභාග ගාස්තුව රු. 400ක් ද, එක් විෂයයක් සඳහා පමණක් පෙනී සිටින්නේනම් විභාග ගාස්තුව රු. 200ක් ද වේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003.02.13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවන්න. තවද එහි ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මොනම කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

8.0 අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමඟ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

9.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11.0 තමන් කැමතිනම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එසේ වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) බැගින් වත් ලබාගත යුතු වේ.

12.0 විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන අතර විභාගය සමත් වූ අපේක්ෂකයන්ගේ නම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කිරීමට කටයුතු කරනු ඇත.

13.0 *විභාග පරිපාටිය.*—අපේක්ෂකයන් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. :-

| *විෂයය* | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 1. කාර්යාල ක්‍රම | 01 | 100 යි | පැය 01 යි |
| 2. ගිණුම් ක්‍රම | 02 | 100 යි | පැය 01 යි |
| 3. පරිගණක පරීක්ෂණය | 03 | 100 යි | පැය 01 1/2 යි |

13.1 කාර්යාල ක්‍රම (විෂය අංකය - 01) :

රජයේ කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව ද රාජකාරී ලිපිලේඛන මැනවින් අවබෝධ කොටගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස්/නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝගය අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව ද පරීක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ. :-

I *වැනි කොටස* - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 25යි)

II *වැනි කොටස* - ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් තුනකට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 75යි)

13.2 ගිණුම් ක්‍රම (විෂය අංකය - 02) :

රජයේ කාර්යාලවල භාවිත වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්යය පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ. :-

I *වැනි කොටස* - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතුය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 25යි)

II *වැනි කොටස* - ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් තුනකට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 75යි)

13.3 පරිගණක පරීක්ෂණය (විෂය අංකය - 03) :
අයදුම්කරුට පහත සඳහන් හැකියාවන් තිබේදැයි පරීක්ෂා කිරීම මෙම පරීක්ෂණයේ අරමුණ වේ.

තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප
වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය
ගොනු කළමනාකරණය

| | |
|---|---|
| වදන් සැකසුම | මූලික කුසලතා, තිරයට හුරුවීම, පාඨ සංස්කරණය<br>පාඨ එකේලි කිරීම, අකුරු වර්ග හා උපලක්ෂණ, අනුච්ඡේද, ඡේද,<br>පේළි අතර පරතරය වෙනස් කිරීම<br>පිමි අනුයෝගය (Tab Setting) පාඨයක් සෙවීම හා ප්‍රතිෂ්ඨාපනය,<br>අක්ෂර හා ව්‍යාකරණ දෝෂ, සමානාර්ථ පද<br>තීරු යෙදීම, පිටු සැකසීම<br>ලේඛන මුද්‍රණය, වගු නිර්මාණය, අනුපිළිවෙළට සැකසීම ගොනු කළමණාකරණය<br>ලේඛනයක් ලිපිනයන් කිහිපයකට යැවීමට සැකසීම<br>මැක්‍රෝ භාවිතය |
| පැතුරුම්පත් | මූලික කුසලතා<br>ආකෘතිකරණය (Formatting)<br>සංස්කරණය<br>තීරු හා පරාස, නව ඇතුළත් කිරීම් හා ඉවත් කිරීම්<br>දත්ත අනුපිළිවෙළට සැකසීම<br>ප්‍රස්තාර සැකසීම<br>මුද්‍රණය<br>@ ශ්‍රිතය (@ Function)<br>මැක්‍රෝ භාවිතය, ගොනු කළමනාකරණය |
| දත්ත සමුදාය | හැඳින්වීම, මූලික කුසලතා<br>දත්ත සමුදාය නිර්මාණය හා භාවිතය<br>ආකෘති<br>සන්ධානගත ආකෘති, උත්පතන ආකෘති (popup forms)<br>සංවාද හා පණිවුඩ කොටු<br>විමසුම්<br>අනුපිළිවෙළට සැකසීම<br>වාර්තා ලබා ගැනීම<br>මැක්‍රෝ භාවිතය |
| ඉදිරිපත් කිරීම්/චිත්‍ර සටහන් | මූලික කුසලතා සංස්කරණය, ආකෘතිකරණය<br>සැලසුම් යෙදීම<br>අනුරූප, පසුරු, සිත්තම් හා ප්‍රස්තාර නිවේශනය<br>කදා මාරුව හා සජීවකරණය, ඉදිරිපත් කිරීමේ මෙවලම් භාවිතය,<br>මාස්ටර් (Master) කදාව සැකසීම<br>කදා මුද්‍රණය හා සටහන් |
| අන්තර්ජාලය | අන්තර්ජාලය හැඳින්වීම, විශ්ව විසිරි ජාලය, මං සොයන ආකාරය<br>ව්‍යවහාරික අන්තර්ජාලය |
| විදුලි තැපෑල<br>(E-mail) | හැඳින්වීම, මූලික කුසලතා, විදුලි තැපෑල ලබා ගැනීම, විදුලි තැපෑල යැවීම, ඊට ප්‍රතිචාර දැක්වීම, ඇමුණුම් භාවිතය, ලිපිනය හඳුනා ගැනීමට කෙටි නාම භාවිතය, පණිවුඩ සම්පාදනය |

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ :

(I) වැනි කොටස - බහුවරණ/කෙටි පිළිතුරු ප්‍රශ්න 40 කින් යුක්ත වේ. කාලය මිනිත්තු 45 යි (ලකුණු 40 යි)

(II) වැනි කොටස - අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 05කි. කාලය මිනිත්තු 45 යි (ලකුණු 60 යි)

සටහන :- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ 5:1:2 ඡේදයට අනුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන පරිගණක මෙහෙයුම් බලපත්‍රය හෝ පරිගණක මෙහෙයුම් බලපත්‍රයට සමාන හෝ ඊට ඉහළ ගුණාත්මක අගයක් ඇති, තෘතීයික

අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ මෙහි උපලේඛනය I හි දැක්වෙන ආයතනවලින් නිකුත් කරන ලද පරිගණක පිළිබඳ සහතික පත්‍ර ලබා ඇති නිලධරයන් මෙම පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

තවද, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන පරිගණක යෙදවුම් සහායක ( මට්ටම 3) සහතිකය ලබා ඇති නිලධරයන් ද මෙම පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

14.0 මෙම විභාග නිවේදනයට විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

බී. පී. පී. එස්. අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2011 ජුනි මස 02 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

## උපලේඛනය I

***තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනවලින් නිකුත් කරන ලද පරිගණක පිළිබඳ සහතිකපත්‍ර සහිත ලේඛනය***

| *Serial No.* | *Name of Institute* | *Address of Institute* | *Course* |
|---|---|---|---|
| 1. | Computer Training Center | No. 09, Dharmarama Mawatha, Colombo 06 | Computer Application Assistant |
| 2. | Computer Training Center - NAITA | Negombo Road, Malkaduwawa, Kurunegala | Computer Application Assistant |
| 3. | Computer Training Center - NAITA | No. 525/2, Maithiripala Senanayaka Mawatha, Rathnanayakepura, Anuradhapura | Computer Application Assistant |
| 4. | Apprenticeship Training Institute | No. 581, Galle Road, Katubedda, Moratuwa | Computer Application Assistant |
| 5. | Computer Training Center - NAITA | Ratalankawatta, Mapalana, Kamburupitiya | Computer Application Assistant |
| 6. | Sri Saranankara Apprentice Training Centre - NAITA | Udawatta, Baddegama | Computer Application Assistant |
| 7. | Computer Training Center - NAITA | Mahaweli Economic Agency Building, Embilipitiya | Computer Application Assistant |
| 8. | Computer Education Center | Divisional Secretariat Office, Anguruwaththa, Madurawela | Computer Application Assistant |
| 9. | Technical College | Werallawatta, Yakkala, Gampaha | Computer Application Assistant |
| 10. | Yovun Nikethanaya | | Computer Application Assistant |
| 11. | Vocational Training Centre | National Youth Services Council, Pallidora Road, Kawdana, Dehiwala | Computer Application Assistant |
| 12. | National Youth Services Council | No. 65, High Level Road, Maharagama | Computer Application Assistant |
| 13. | Don Bosco Vocational Training Centre | Puttalam Road, Nochchiyagama | Computer Application Assistant |
| 14. | Institute of Professional Computer Systems | No. 178A, Colombo Road, Ratnapura | Computer Application Assistant |
| 15. | Technology and Computer Training Institute | No. 15, 1/1, Piyadasa Sirisena Mawatha, Maradana, Colombo 10. | Computer Application Assistant |
| 16. | Cholankanda Youth Trainng Centre | Udahenthanna, S. P. O. 20506, *Via* Gampola | Computer Application Assistant |
| 17. | Bishop Leo Technical Institute | USCOD Centre, St. Bedes Home, Badulla | Computer Application Assistant |
| 18. | SOS Children's Village of Sri Lanka | Vocational Training Centre, Maduruketiya, Monaragala | Computer Application Assistant |
| 19. | Beeta Com Multimedia and Computer Studies | No. 20, Danovita Road, Meerigama | Computer Application Assistant |
| 20. | Don Bosco Technical Centre | No. 22, Don Bosco Mawatha, Ettukala, Negombo | Computer Application Assistant |
| 21. | Rathanasela Nenasala Computer Centre | Rathanasela Pirivena, Weegama, Rathmale, Ku/Itanawatta | Computer Application Assistant |

| *Serial No.* | *Name of Institute* | *Address of Institute* | *Course* |
|---|---|---|---|
| 22. | Navoda Computer Education Institute | No. 72, Devananda Road, Navinna, Maharagama | Computer Application Assistant |
| 23. | N. K. I. Computer Training Institute | Manahara Building, Pituwala Road, Elpitiya | Computer Application Assistant |
| 24. | Lanka Tech Computer | No. 2/52, Horana Road, Piliyandala | Computer Application Assistant |
| 25. | M. D. P. Computer Training Institute | No. 64/A/1, Station Road, Kadana | Computer Application Assistant |
| 26. | Infornet Computer Systems | No. 143/1A, Ananda Senanayaka Complex, Katuwana Road, Homagama | Computer Application Assistant |
| 27. | Informax Computer Technology | No. 52, Matale Road, Galewela | Computer Application Assistant |
| 28. | Advance Training Centre (ATC) | No. 02, Inginiyagala Road, Ampara | Computer Application Assistant |
| 29. | Thondaman Vocational Training Centre | Saumymoorthi Thondaman Memorial Foundation Pool Bank Hatton | Computer Application Assistant |
| 30. | Sri Lanka Nippon Education and Cultural Center | Mahindarama Road, Ethulkotte, Kotte | Computer Application Assistant |
| 31. | Rural Vocational Training Centre | Mudukatuwa, Marawila | Computer Application Assistant |
| 32. | District Vocational Training Centre | Galigamuwa Town, Ballapana, Kegalle | Computer Application Assistant |
| 33. | National Vocational Training Centre | No. 354, Elvitigala Mawatha, Narahenpita, Colombo 05 | Computer Application Assistant |
| 34. | District Vocational Training Centre | Saragama, Kurunagala | Computer Application Assistant |
| 35. | National Vocational Training Institute | No. 100, Kandawala Road, Ratmalana | Computer Application Assistant |
| 36. | Rural Vocational Training Centre, Weherahena | Meeta Social Service Foundation, Weherahena, Matara | Computer Application Assistant |
| 37. | District Vocational Training Centre | Wattha, Tissa Road, Wellawaya | Computer Application Assistant |
| 38. | Agonsu Training Center | Saranawattha, Nayamulla, Morawaka | Computer Application Assistant |
| 39. | Special Vocational Training Centre | Higher Computer Training Institute, Fort, Matara | Computer Application Assistant |
| 40. | Kubalgama Sunami Vocational Training Centre | Sri Jinendraramaya, Kubalgama, Weligama | Computer Application Assistant |
| 41. | Lakviru Sevana Rural Vocational Training Centre | No. 48, Bodhirukkarama Mawatha, Wellawaththa, Colombo 06 | Computer Application Assistant |
| 42. | National Vocational Training Institute | Niyagama, Thalgaswala | Computer Application Assistant |
| 43. | District Vocational Training Centre | Mirijjawila, Hambanthota | Computer Application Assistant |
| 44. | Rural Vocational Training Centre | Erukkalampiddy, Nagavillu, Palavi | Computer Application Assistant |

**ආදර්ශ අයදුම්පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියේ නිලධාරීන් සඳහා වන පරිගණක**
**හැකියාව විමසන ලිඛිත පරීක්ෂණය සහ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010 (I) (2011)**

Efficiency Bar Examination and the Written Test on Computer Skills for Officers in Class III of Public Management Assistants' service - 2010 (I) 2011

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| 1. | |
| 2. | |

(*ගැසට් නිවේදනය අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර කැමැත්තේ අනුපිළිවෙලට සඳහන් කරන්න.*)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

*විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :*

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ :- SILVA, A. B.
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ☐
ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.3 ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐

4.0 ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත් වන විෂයය/විෂයයන් (ගැසට් නිවේදනයේ 13.0 වැනි ඡේදය බලන්න)

| *අනු. අංකය* | *විෂයය* | *විෂය අංකය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |

5.0 දැනට දරන තනතුර :
5.1 තනතුර :————.
5.2 පත්වීම් ලිපියේ අංකය :————.

6.0 6.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.
6.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
6.3 දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
6.4 ලදුපත් අංකය :————.
6.5 දිනය :————.

සම්පූර්ණ විභාග ගාස්තුව රු. 400ක් ද එක් විෂයක් සඳහා රු. 200ක් ද වන අතර එම මුදල ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රු. ........................ ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————.
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

සටහන : තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ...................................... මහතා/මහත්මිය/මෙනෙවිය ................................ වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
(ii) නිලධාරියා/නිලධාරිණිය* මෙම විභාගයට මීට පෙර පෙනී සිටි/නොසිටි* බවත්,
(iii) නිලධාරියා/නිලධාරිණිය* මෙයට පෙර විභාගයට පෙනී සිට ඇති නිසා නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවත්,
(iv) නිලධාරියා/නිලධාරිණිය* මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්, මම සහතික කරමි.

* අනවශ්‍ය දෑ කපා හරින්න.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

06-352

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වැනි පන්තියේ, II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2011

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2011 සැප්තැම්බර් මස කොළඹ දී පැවැත්වේ. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් විභාගය පවත්වනු ලබන අතර, ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනිකුත් විධිවිධාන, අංක 1070/13- 1999 මාර්තු මස 11 වැනි දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇත. පහසුව සඳහා එම විෂය නිර්දේශය සහ අනිකුත් විධිවිධාන පහත දක්වා ඇත.

නිලධාරියෙකුට මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට නියමිත විෂයයන් සඳහා එකම වතාවක දී හෝ වෙන වෙනම අවස්ථාවල දී හෝ පෙනී සිටිය හැක.

***(අ) විෂය නිර්දේශය***

| *විෂය අංකය* | *විෂයය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 01. | සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු<br>රජයේ ආයතන සංග්‍රහයේ i, ii, iii, iv, v, vii, viii, ix, xii, xiii, xiv, xxiv, xxviii, xxx හා xxxi යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව ආයතන සංග්‍රහයේ නීති | 100 යි | පැය 1 1/2 යි. |
| 02. | *මුදල් රෙගුලාසි* :<br>රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1වැනි කොටසේ i, ii, v, viii, xii, හා xiv පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව | 100 යි | පැය 1 1/2 යි |
| 03. | *අධ්‍යාපන නීතිය* :<br>අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් ආඥාපනත් හා පාර්ලිමේන්තු පනත් පිළිබඳව දැනුමක් අපේක්ෂා කෙරේ | 100 යි | පැය 2යි |

(i) 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි.

(ii) 1960 අංක 5 දරන උපකෘත පාඨශාලා හා ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත.

(iii) 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා ගුරු විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත.

(iv) 1976 අංක 15 දරන ප්‍රසිද්ධ විභාග (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත.

(v) 1981 අංක 65 දරන උපකෘත පාඨශාලා (විශේෂ විධිවිධාන) පනත.

(vi) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත.

(vii) 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත.

(viii) 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත.

(ix) 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය පනත.

(x) 13 වැනි සංශෝධනයට හා මූලික අයිතිවාසිකම් පිළිබඳ 3 වැනි පරිච්ඡේදයට විශේෂ අවධානය ඇතිව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

(xi) අධ්‍යාපනයට අදාළව පළාත් සභා විසින් පනවා ඇති ප්‍රඥප්ති.

*සැ. යු*— අපේක්ෂකයින් කාර්යක්ෂමතා විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා යටත් පිරිසෙයින් 40% ක් බැගින් වූ ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

03. *විභාගයේ භාෂා මාධ්‍යය* :

(i) අපේක්ෂකයින්ට රාජ්‍ය භාෂාව හෝ ජාතික භාෂාව හෝ යන එකකින් පිළිතුරු ලිවිය හැකිය.

(ii) අපේක්ෂකයා රාජ්‍ය සේවයට ඇතුළුවීමට පෙර පෙනී සිටි තරග විභාගයේ භාෂා මාධ්‍යය හෝ තරග විභාගයක් නොමැතිව රජයේ සේවයට බැඳුනු අය සම්බන්ධයෙන් රජයේ සේවයට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් පිළිතුරු ලිවිය හැක.

04. අපේක්ෂකයෙකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

05. ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව සකසා ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම් පත්‍රයේ සියලුම ශීර්ෂයන් පළමුවැනි පිටුවට වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව සඳහන් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වන අතර, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීමේ දී එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, සඳහන් කළ යුතු ය.

06. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති.

07. ඉල්ලුම් පත්‍ර 2011 වර්ෂයේ ජූලි මස 18 වැනි දින හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව එවනු ලබන කවර හෝ ඉල්ලුම් පත්‍රයක් වුව ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 -II කාර්යක්ෂමතා කඩඉම් විභාගය" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

08. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු යි. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා විභාග ගාස්තු ගෙවූයේ නම් එම මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබා ගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

09. ඉහත 08 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි සළකා බලනු නොලැබේ.

10. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

11. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වන අතර, ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතුරින් කුමක් වුවත් වලංගු වේ. :—

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

13. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු ගෙවිය යුතුය. :—

(*අ*) පළමු වතාවට විභාගයට පෙනී සිටින අයගෙන් සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.;

(*ආ*) සම්පූර්ණ විභාග ගාස්තු රු. 300 කි.
එක් විෂයයකට රු. 100 කි.

විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003.02.13ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයෙන් අලවන්න. (තව ද එහි ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.).

එච්. එම්. ගුණසේකර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2011 ජූනි මස 02 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

**ඉල්ලුම් පත්‍රය**

*ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2011*

*Efficiency Bar Examination in Class 2 Grade II of Sri Lanka Teacher Educators' Service -2011*

ඉල්ලුම් පත්‍ර, විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනය වෙත ආයතන ප්‍රධානියා මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

(විභාගයේ නම, කවරයේ වමත් පස ඉහළ කෙළවරේ දැක්විය යුතුය.)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- සිංහල - 2 දෙමළ - 3 ඉංග්‍රීසි - 4 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1. (අ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා : SILVA, A. B.

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3. (i) පදවි නාමය :————.

(ii) සේවය කරන විද්‍යා පීඨය/ගුරු විද්‍යාලය/ගුරු මධ්‍යස්ථානය හා ලිපිනය (ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට එවනු ලැබේ) :————.

4. පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

5. නිවේදනයේ 2 වැනි ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය හා විෂය සහිතව ගන්නා විෂයයන් පැහැදිළිව සඳහන් කළ යුතුය. :

| *විෂය අංකය* | *විෂයයේ නම* |
|---|---|
| | |
| | |
| | |

6. මීට ප්‍රථම මෙම විභාගයට සම්පූර්ණ ලෙස හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටියේ ද ? එසේ නම් විෂයයන් හා පෙනී සිටි වර්ෂය හා මාධ්‍යය සඳහන් කරන්න. :

| *විෂයය* | *වර්ෂය* | *මාධ්‍යය* | *විභාග අංකය* |
|---|---|---|---|
| | | | |
| | | | |

7. *ගෙවන ලද විභාග ගාස්තු :*

| විභාග ගාස්තු ගෙවා ලදුපත මෙහි අලවන්න. ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. |
|---|

8. ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ගැසට් නිවේදනයේ 03 වැනි ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

ඉදිරිපත් කරමි.

01. මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ගැසට් නිවේදනයේ 03 වැනි ඡේදයට අනුව ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

02. අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
පීඨාධිපතිගේ/ගුරු මධ්‍යස්ථානාධිපතිගේ
අත්සන හා පදවි නාමය.

දිනය :————.

06-367

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය - 2011 සැප්තැම්බර්
(සිංහල/දෙමළ, I/II/III මට්ටම්)

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2007 හා 7/2007 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පැවැත්වීමට නියමිත පහත සඳහන් ලිඛිත විභාග සඳහා රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතුවුවන්ගේ ඉල්ලුම්පත් මෙයින් කැඳවනු ලැබේ. :-

| *විභාගය* | *භාෂාව* | *මට්ටම* |
|---|---|---|
| 1. රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය | සිංහල/දෙමළ | III වැනි මට්ටම |
| 2. රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය | සිංහල/දෙමළ | II වැනි මට්ටම |
| 3. රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය | සිංහල/දෙමළ | I වැනි මට්ටම |

සටහන : - III වැනි මට්ටම පහළ මට්ටම වන අතර I වැනි මට්ටම ඉහළ මට්ටම වේ.
- තම සේවයට අදාළ වන්නාවූ මට්ටම ඉහත චක්‍රලේඛ අනුව නිශ්චය කරගත යුතු වේ.

02. මෙම ලිඛිත විභාගවලට අදාළ විෂය නිර්දේශ, විභාග පටිපාටිය, අයදුම්පත් ආකෘතිය හා අදාළ විස්තර www.languagesdept.gov.lk රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකිය.

03. ලිඛිත විභාගය සඳහා දිවයිනේ ඒ ඒ පළාත්වල විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක ඇමුණුම 01 හි සඳහන් වේ. යම් නගරයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවුනහොත් එම විභාග මධ්‍යස්ථාන අවලංගු කර, එම අයදුම්කරුවන් ඉල්ලා ඇති දෙවන/තුන්වන කැමැත්තකට අනුව එම විභාග මධ්‍යස්ථාන වෙත යොමු කෙරේ. විභාගයට පෙනීසිටීමට ඉල්ලුම්කල නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. මෙම ලිඛිත විභාගයෙන් සමත්වුවන් සඳහා වාචික පරීක්ෂණ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබෙ.

05. ඉහත වෙබ් අඩවියෙන් ලබා ගත් අයදුම්පත් ආකෘතිය අනුව පහත සඳහන් උපදෙස්වලට අනුකූලවනසේ ඉල්ලුම්පත් සම්පූර්ණ කර අදාළ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය හා නිලමුද්‍රාව සහිතව 2011 ජූලි 18 වැනි දිනට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ වමත්පස ඉහළ කෙළවරෙහි ''රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය - 2011 සැප්තැම්බර්'' යනුවෙන් සඳහන් කරන්න. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 09 තෙක් පළමුවන පිටුවට ද ඉතිරි කොටස දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කල යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ඔබට ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය වෙබ් අඩවියෙන් ලබාගත් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුන හොත් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත පිළියෙල කර ගන්නා විට, එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යොදන්න. ඉල්ලුම් කරන භාෂාව හා ඉල්ලුම් කරන මට්ටම පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

මෙම විභාගය 2011 සැප්තැම්බර් මාසයේ දී පවත්වනු ලැබේ.

06. ඉහත උපදෙස්වලට පටහැනි හෝ අසම්පූර්ණ වූ හෝ අවසාන දිනට පසුව එවනු ලැබුවා වූ හෝ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. විභාගයට ප්‍රථම වතාවට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් විභාග ගාස්තුවක් අය නොකෙරේ. අනෙකුත් අයදුම්කරුවන් සඳහා රු. 150 ක විභාග ගාස්තුවක් අය කෙරේ. එම විභාග ගාස්තුව දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. තව ද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තු " 20.03.99.00. වෙනත්" යන ආදායම් ශීර්ෂ අංකයට බැර කළ යුතු වේ.

08. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සියේ පිටපතක් ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍ර එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

09. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

10. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණකි.

11. ලිඛිත විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

12. මෙම ලිඛිත විභාගය සම්බන්ධයෙන්, ඉහත සඳහන් නොවන කරුණු පිළිබඳ අවසාන තීරණය අදාළ පරිදි විභාග කොමසාරිස් ජනරාල් හා/හෝ රාජ්‍ය භාෂා කොමසාරිස් සතුය.

13. වැඩි විස්තර සඳහා දුරකථන අංක 011-2889506, 011-2888934 x 220/227 අමතන්න.

ජේ. සී. රණේපුර,
රාජ්‍ය භාෂා කොමසාරිස්.

කාර්යාලයීය ප්‍රායෝජනය සඳහා
..................................................................

**රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත I. II. III මට්ටම සිංහල/දෙමළ විභාගය - 2011 සැප්තැම්බර්**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

**Written Examination for Official Language Proficiency - Level I, II, III Sinhala/Tamil 2011 September**
**Department of Examinations, Sri Lanka**
**Department of Official Languages**

* විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය (කැමැත්තේ අනුපිළිවෙළට) (නිවේදනයේ ඇමුණුම 01 ට අනුව)

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |

ඉල්ලුම් කරන භාෂාව
සිංහල -2 දෙමළ - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

* ඉල්ලුම් කරන මට්ටම
I වන මට්ටම - 1
II වන මට්ටම - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
III වන මට්ටම - 3

1. මුලකුරු අගට යොදා, අයදුම්කරුගේ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (උදා : GAMINI H. W.) :—————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
3. රාජකාරි ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
   (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කෙරේ) :—————.
4. දිස්ත්‍රික්කය :—————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 01 පුරුෂ 0 :
   (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
6. ජාතික හැඳුනුම්පත් අංකය :
7. දුරකථන අංකය :
8. උපන්දිනය
   වර්ෂය : මාසය : දිනය :
9. (අ) ඔබගේ තනතුර (සම්පූර්ණ තනතුර/සේවා නාමය ලියන්න) :—————.

   (ආ) ඔබගේ තනතුර මධ්‍යම රාජ්‍ය සේවයට අයත් - 1
   පළාත් රාජ්‍ය සේවයට අයත් - 2
   (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
10. ඉල්ලුම් කරන භාෂාව පිළිබඳව ඔබගේ හැකියාව සනාථ කරන්නේ :—————.
    (අ) අදාළ සහතිකයේ නම (තිබේ නම් පමණක්)
    (ආ) ප්‍රදානය කළ ආයතනය :—————.
    (ඇ) නිකුත් කළ වර්ෂය :—————.
11. (අ) මීට පෙර පැවැත්වූ ලිඛිත භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලට ඔබ පෙනී සිටියෙහි ද? :—————.
    (විභාගයේ කොටසක් සම්පූර්ණ කිරීමට ඇත්නම් අසමත් කොටස මෙහි සඳහන් කළ යුතුය)

    (ආ) අසමත් කොටස :—————.
    එම විභාගයේ විභාග අංකය හා දිනය :—————.

    විභාග අංකය :—————. විභාග දිනය :—————.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, මෙම භාෂාව සම්බන්ධයෙන් වෙනත් මට්ටමක් සඳහා මෙම විභාගයට ඉල්ලුම් කර නැති බවත්, සහතික කරන අතර විභාගය සම්බන්ධව ඕනෑම කරුණක් පිළිබඳව රාජ්‍ය භාෂා කොමසාරිස්ගේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගන්නා බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් හා/හෝ රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

අත්සන :—————. (ආයතන ප්‍රධානියා ඉදිරිපිට දී අත්සන තබන්න)

නම :—————.

දිනය :—————.

### ආයතන ප්‍රධානියාගේ සහතිකය

ඉහත අයදුම්කරු මාගේ කාර්යාලයේ සේවය කරන බවත්, අයදුම්පත්‍රයේ අංක 1 සිට 11 දක්වා ඡේදයන්හි සඳහන් තොරතුරු නිවැරදි බවත් ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී ........... දින තබන ලද බවත් සහතික කරමි.

අත්සන :—————. දිනය :—————.

නම :—————.

තනතුර :—————.

නිල මුද්‍රාව

> විභාග ගාස්තු ගෙවූයේ නම් එම ලදුපත මෙහි අලවන්න.
> (ලදුපතේ ඡායා පිටපතක් ළඟතබා ගැනීම අත්‍යාවශ්‍ය වනු ඇත.)

ඇමුණුම 01

### විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක

| පළාත | නගරය | නගර අංකය |
|---|---|---|
| බස්නාහිර පළාත | කොළඹ | 1 |
| | ගම්පහ | 2 |
| | කළුතර | 3 |
| වයඹ පළාත | කුරුණෑගල | 4 |
| | හලාවත | 5 |
| දකුණු පළාත | ගාල්ල | 6 |
| | මාතර | 7 |
| | තංගල්ල | 8 |
| සබරගමු පළාත | රත්නපුරය | 9 |
| | කෑගල්ල | 10 |
| ඌව පළාත | බදුල්ල | 11 |
| | මොණරාගල | 12 |

| පළාත | නගරය | නගර අංකය | පළාත | නගරය | නගර අංකය |
|---|---|---|---|---|---|
| මධ්‍යම පළාත | නුවර | 13 | | කිලිනොච්චි | 21 |
| | මාතලේ | 14 | | මන්නාරම | 22 |
| | නුවරඑළිය | 15 | | | |
| | | | නැගෙනහිර පළාත | ත්‍රිකුණාමලය | 23 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 16 | | මඩකලපුව | 24 |
| | පොලොන්නරුව | 17 | | අම්පාර | 25 |
| උතුරු පළාත | යාපනය | 18 | | | |
| | වවුනියාව | 19 | | | |
| | මුලතිව් | 20 | | | |

07-368

---

**නිවැරදි කිරීමයි**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

2011.05.27 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1708 දරන ගැසට් පත්‍රයේ I:IIA - (විභාග) කොටසේ 05-725 දරන දැන්වීමේ "කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2011" ලෙස මුද්‍රණය වී ඇති මාතෘකාව "කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය 2010" ලෙස නිවැරදි විය යුතුය.

අනුර එදිරිසිංහ,
විභාග කොමසාරිස් ජනරාල්.

2011 මැයි මස 31 වැනි දින,
පැලවත්ත,
බත්තරමුල්ල.
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

06-507

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.